ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ සංරචක I - 2020
---------------------------------------------------------------------------------------

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ සංරචක I හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර බැංකුව අතර 2019 ජනවාරි 23 දිනැතිව ඇති කර ගත් අංක 8878-LK දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
--------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගීත්වය සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් සංරචක 1 සහ සංරචක 11 වශයෙන් බෙදා වෙන් කර ඇති අතර සංරචක 1 මධ්‍යම මට්ටමින් සහ පළාත් මට්ටමින් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දිවයිනේ තෝරාගත් ප්‍රදේශවල අධි අවදානම් ජනගහන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවල උපයෝජනය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 31,588 ට සමාන එජඩො මිලියන 200 ක් වූ අතර එයින් රු. මිලියන 8,030.46 ට සමාන එජඩො මිලියන 50.845 ක් ව්‍යාපෘතියේ I සංරචකය සඳහා වෙන් කරන ලදී. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2019 ජනවාරි 23 වන දින ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

1.3 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් සිදු වන බලපෑම් හැර, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ඒකාබද්ධ වියදම් ප්‍රකාශය හා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | | රු. මිලියන | | |
| (අ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, අරමුදල් සපයන නියෝජිතායතනය මගින් **2020** දෙසැම්බර් **31** දිනට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන **9,851** ක් ලබා දී ඇත. එයින් **1** වන සංරචකය සඳහා රු. මිලියන **4,317** ක් පමණක් මුදා හැර ඇත. කෙසේ වෙතත්, රු. මිලියන **4,169** ක් හෙළිදරව් කර ඇති අතර ඉතිරි රු.මිලියන **5,534** මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. තවද, මහා භාණ්ඩාගාරය මගින් නිදහස් කරන ලද මුදල සහ ව්‍යාපෘතියට ලැබුණු මුදල අතර රු.මිලියන **231** ක වෙනසක් පැවතීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | **5,534** | නිරීක්ෂණය පිළිගෙන ඇති අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) සහ ව්‍යාපෘති කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අතර සැසඳීමක් සිදු කිරීම මගින් වෙනස හඳුනා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. | ව්‍යාපෘතිය සඳහා ලැබුණු සියලුම අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, **2019** දී ණය දෙන නියෝජිතායතනය විසින් අය කරන ලද ඉදිරිපස අන්ත ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | **88.91** | **2021** වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත. | සියලුම වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | **2020** දෙසැම්බර් **31** දිනට බැංකු ශේෂය සනාථ කිරීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත. | **52.28** | නිරීක්ෂණය පිළිගෙන ඇති අතර ශේෂ සනාථ කිරීමේ ලිපි හැකි ඉක්මනින් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ සනාථ කිරීමේ ලිපි සෘජුවම විගණකවරුන් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර වත්කම් සහ පළාත් මට්ටමේ සිවිල් කටයුතු සඳහා සවිස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | **2,983.38** | **2021** වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ පළාත් අනුව උපලේඛන ද ඉදිරිපත් කරනු ලැබේ. | විගණනය සඳහා සවිස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ------- | --------------- | -------------------- | ------------------------------ | -------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 626 මුදල් රෙගුලාසිය | වාර්ෂික ගිණුම පිළියෙළ කිරීම පහසු කිරීම සඳහා ද්විත්ව සටහන් පදනම මත පොත් සහ වාර්තා තබා ගත යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ පළාත් සහ මධ්‍යම මට්ටමින් ද්විත්ව සටහන් අවශ්‍යතා පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2022 වසරේ සිට ද්විත්ව සටහන් පාදක ගිණුම්කරණ ක්‍රමය පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසියට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | 2016 ජුනි 10 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 සහ 2018 ජුනි 04 දිනැති ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 64 වැනි ඡේදය | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබීම හෝ ව්‍යාපෘතියේ ගනුදෙනු සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකක මගින් විගණනය කර නොතිබීම. | අනුමැතිය ලැබීමෙන් වහාම පසුව, ව්‍යාපෘතිය මගින් අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත. නව අභ්‍යන්තර විගණකවරයා රාජ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශ සමඟ සමායෝජනයෙන් විගණන කටයුතු ආරම්භ කර ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 | පළාත් කාර්යාල සහ ව්‍යාපෘති කාර්යාලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙළ කර නොතිබුණි. | පළාත් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන වර්තමානයේ පවත්වාගෙන යනු ලබන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් අත්පත් කර ගන්නා වත්කම් සඳහා ද ස්ථාවර වත්කම් ලේඛන පිළියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. |

**3.1** භෞතික කාර්යසාධනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතියේ ප්‍රගතිය මැනීම සඳහා පිහිටුවා ඇති වියපැහැදම් කිරීමේ සබැඳි දර්ශක (DLI) 04 න් 2020 දෙසැම්බර් 31 වන විට ලබා ගැනීමට අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 40.16 කි. මේ අනුව, ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම දුෂ්කර බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගතය ආරම්භ වීම හේතුවෙන්, 2020 වසර සඳහා සත්‍යාපනය කිරීමේ දිනය 2021 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලද අතර ඒ වන විට වියපැහැදම් කිරීමේ සබැඳි දර්ශක (DLI) බොහොමයක් සාක්ෂාත් කරගෙන තිබූ අතර එමඟින් අරමුදල් වියපැහැදම් කිරීම සාර්ථකව සිදු කළ හැකි විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ 1 වන සංරචකය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 70 ක් පමණ පළාත් සෞඛ්‍ය සේවය සඳහා වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ මුදලින් රු. මිලියන 94.13 ක් පළාත් සෞඛ්‍ය සේවා සඳහා වැය කර තිබුණි. . | අනෙකුත් ක්‍රියාකාරකම් පළාත් ආයතනවල සිදුවී ඇති අතර, අධීක්ෂණය සහ නියාමනය කිරීමේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අතිරේක ලේකම්වරුන් වෙත පැවරේ. එබැවින්, ඔවුන් විසින් ඔවුන්ගේ විෂයපථය යටතේ පවතින සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කර ඇත. | පළාත් මට්ටමේ සහ මධ්‍යම මට්ටමේ ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුයි. |
| (ඇ) | ව්‍යාපෘතියේ මධ්‍යම මට්ටමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විධිමත් සැලැස්මකට අනුව ව්‍යාපෘති අරමුදල් භාවිතා කර නොතිබුණි. ඒ වෙනුවට සෞඛ්‍ය අංශයේ විවිධ ආයතන, අංශ සහ පුද්ගලයන්ට රු. මිලියන 217.2 ක් ලබා දී තිබුණු අතර ඔවුන්ගේ ප්‍රමුඛතා සඳහා එම මුදල් වැය කර තිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ජාතික තත්ත්ව වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් වශයෙන් මධ්‍යම හෝ පළාත් ආයතනවල ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍යයෙන්ම ක්‍රියාත්මක වේ. රු.22,614,681 ක් වන සියලුම වියදම් අභිමත අරමුණට අදාළ වන බැවින් විගණන නිරීක්ෂණ පිළිගත නොහැකිය. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිශ්චිත සැලැස්මකට අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන වැය කළ යුතුය. |

**3.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසාන වී මාස දෙකක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 1 වන සංරචකයේ මධ්‍යම මට්ටමේ මූල්‍ය ප්‍රකාශය සහ 1 වන සංරචකයේ 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2021 ඔක්තෝබර් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කරනු ලැබේ. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |